ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 ජුනි 18 සඳුදා
04 වෙළුම - 34 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



ඡායා : නිලූෂා අලහකෝන්

## පූජා සහයක දරුවන්ගේ දිනය

### හැම පූජා සහයක දරුවෙකුටම දේව කැඳවීමක් ඇත

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# අද පුජා සහයක දරුවා හෙට පුජා ප්‍රසාදි තුමෙකුසේ ඔබ අතරට පැමිණෙනු ඇත.

## ආදරණීය දුවේ පුතේ...

පුජා සහයක දරුවන්ට කතෝලික සභාව තුළ විශේෂ තැනක් හිමිවෙනවා. හැම දෙව් මැදුරකම පුජා සහයක දරුවන්ගේ සමිති පිහිටුවලා එම දරුවන්ට විශේෂත්වයක් දක්වන්නේ පුජා ප්‍රසාදි තුමාට සහය වෙමින් දිව්‍ය යාගය පුද කරනු ලබන මොහොතෙ පුදසුන අභියස විශේෂාකාරයෙන් එම දරුවන් උතුම් සේවාවක් පුදනු ලබන නිසයි. දැන් ඔබට හිතාගන්නට පුළුවන් නේද ඔබේ මීසමේ දේවස්ථානයේ පුජා සහයක දරුවන් හට හිමි විය යුතු වැදගත් ස්ථානය කෙලෙස විය යුතුද කියලා.

ආදර දුවේ පුතේ, මෙවර පුජා සහයක දරුවන්ගේ උත්සවය පැවැත්වුයේ කොළඹ සා. ඇලෝසියස් දෙව්සත්හලේ පරිසරය තුළයි. ඒ පමණක් නොවේ. මෙවර කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ මෙහෙය වීමෙන් දෙව්සත්හලේ අදියුරු පියතුමන් ඇතුළු අනෙකුත් පියවරුන්ගේ සහයෙන් ඉතාමත් අලංකාරව මෙම උත්සවය සංවිධානය කර තිබුණා. අද ශ්‍රී ලංකාවේ කතෝලික සභාව තුළ පුජා සහයක දරුවන්ගේ සේවාව කෙතරම් උතුම්ද, ඒ වගේම එම සේවාව මුළු මහත් කතෝලික සභාවම කෙතරම් අගය කරනවාද කියන ඒ පණිවිඩය හොඳටම ලබා දෙන්නට එම උත්සවයේ සියලු වැඩ කටයුතු සංවිධානය වී තිබුනා. සම්පූර්ණ දවසක්ම කැප කිරීමෙන් මේ පුජා සහයක දරුවන්ගේ ඇගැයීම කෙතරම් ඉහළින් තිබුනාද කියලා ඔබට වටහා ගන්නට පුළුවන් නේද?.

ආදර දුවේ පුතේ, අල්තාරය පාමුල දිනපතා දිව්‍ය යාගය තුළ දණ නමා යාච්ඤා කරන පුජා සහයක දරුවෙක් තුළ අනිවාර්යයෙන්ම ශුද්ධවන්තභාවයක් පිහිටා තිබෙනවා. පුජා සහයක කියන වදනෙම එම උතුම් බව ගැබ්වී තිබෙනවා. අද මුළු මහත් රටේම කතෝලික පදවි තුළ සේවය කරන සෑම පියතුමෙක්ම තමන්ගේ ළමා කාලය තුළදී මෙම උතුම් අත්දැකීම ලබා තිබෙනවා. ඒ හැම පියතුමෙකු හටම සිය දේව කැඳවීම උරගා බලන්නට හා ඒ සිතිවිල්ල පහල කර ගැනීමට මහෝපකාරී වුයේ පුජා සහයක ජීවිත අත්දැකීමයි. තවත් ක්‍රිස්තු වරයෙක් හැටියට අල්තාරය වටා ඇති පරිසරයේ සැරිසරන පුජා සහයක දරුවන් තුළ නිරායාසයෙන්ම අවංක කම , කැපවීම, බැහැපත් කම, කීකරු කම, දක්‍ෂතාවය රැදි පැවතිය යුතුයි. එම වටිනා ගුණාංග තමයි පසු කලෙක ජීවිතයේ පරිනත අත්දැකීම ලබා ගන්නට ඒ අයව මෙහෙය වනු ලබන්නේ. ඒ නිසා දේව කැඳවීම ජීවිතයේ අවබෝධ කර ගන්නට හා එය ගවේෂණය කොට මතු කර ගන්නට පුජා සහයක අත්දැකීම් බෙහෙවින්ම ඉවහල් වෙන බව මතක තබා ගත යුතුයි. පිරිමි දරුවන් පමණක් නොවේ. ගැහැණු දරුවන්ටත් පුජා සහයක දරුවන්සේ කැපවී වැඩ කරන්නට පිළිවන්. අද විදේශ රටවල දේවස්ථාන පරිසරයේ පිරිමි ළමුන් හා සමග කරට කර ගැහැණු ළමයි පවා පුජා සහයක දරුවන් සේ කැපවී කටයුතු කරන බව පැහැදිලිවම දැක ගන්නට පිළිවන්. ඉතිං ඒ ගැහැණු දරුවන්ට පවා පසු කලෙක පැවදි ජීවිතයට ඇතුල් වන්නට මේ පුජා සහයක අත්වැල හොඳ මඟක් බවට පත්වී තිබෙනවා.

ආදර දුවේ පුතේ, දැන් ඔබ පුජා සහයක දරුවෙක් නම් මේ පැවසු සියල්ලෙන් හොඳ පිංතුරයක් ඔබේ මනසේ සිතුවම් වෙන්නට ඕනා. පුජා සහයක දරුවෙක් වන්නට ඔබ තවමත් පෙරුම් පුරනවා නම් මේ පවසන සියල්ල කෙරෙහි ආයෙත් අළුතින් හිතන්නට ඔබ කැප වෙන්නට ඕනා. පුජා සහයක දරුවන් අනිත් දරුවන් හට කදිම ආදර්ශයක් වන්නට ඕනා. දේවස්ථනයේ පමණක් නොවෙයි. ඉගෙන ගන්නා පාසැලේදී පවා ඔබ වැදගත් තැනක් හා තත්ත්වයක් හිමිකර ගන්නෙ පුජා සහයක දරුවෙක් වන නිසයි.

ආදර දුවේ පුතේ, පුජා සහයක දරුවා නිතරම ක්‍රිස්තුස් වහන්සේ හා එක මඟ ගමන් කරන තැනැත්තෙක්. ඒ නිසාමයි පුජා සහයක දරුවෙක්ගෙන් අපේක්ෂා කරන දෑ වලට පවා ඉහලින්ම වටිනා කමින් ලබා දෙන්නට සමස්ත සභාව නිරතුරුවම කටයුතු කරනු ලබන්නේ.

දැන් නැවතත් දිව්‍ය පුජා සංග්‍රහයේ අළුත් වෙනස් කම් කිහිපයක් ඇතිවී තිබෙනවා. ඒ නව දිව්‍ය යාගයට සම්බන්ධ වන්නේ කෙසේ ද කියා පුජා සහයක දරුවා තුළ උනන්දුවක් හා ගවේෂණ මනසක් තිබිය යුතුයි. පෙර කල පුජා සහයක දරුවෙක් සේ සිට අද වැඩිහිටි ලෝකයේ සිටින බොහෝ දෙනෙක් එදා ඒ මිහිරි අතීතයේ අත්දැකිම් යලි මතක් කරන්නේ ඉතාමත්ම කෘතගුණ පුර්වකවයි. ඔබටත් මතු අනාගතයේ ඒ ශක්තියෙන්ම කථා කරන්නට අද දවසේ මෙම පුජා සහයක සේවාව උපරිමයෙන්ම ඉටු කරන්නට වග බලා ගන්න. දේව කැඳවීමට සවන් දෙන්න. මතු අනාගතයේ සිරිලක් කතෝලික සසුන් කෙත අස්වද්දන ගොවීන් සේ පෙරට එන්න පුජා සහයක දුත සේවාව ඔබට ශක්තියක්ම වේවා !

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# පූජා සහයක දරුවා සහ අනාගත පූජක පුතකු අතර ඇත්තේ වෙන් කළ නොහැකි සම්බන්ධතාවයකි.

බොරැල්ල ශා. ඇලෝසියස් දෙව්සත්හල් අදියුරු ගරු ලලිත් ෆීලික්ස් පෙරේරා පියතුමා

ඈත ඉතිහාසයකට නෑකම් කියන දෙව් පුද සේවා දිනය සා. ඇලෝසියස් දෙව්සත්හලේ මව් සෙවනේ මෙවරද පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙවර දෙව් පුද සේවා දිනය නව මුහුණු වරකින් පැවැත්වීමට පිඹුරු පත් සකස් කෙරුනේ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ අදහසක් අනුවය. ඒ අනුව මෙවර පූජා සහයක දරු දිනය ජූනි 16 වන දින පෙ.ව 9.00 ට අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ආශිර්වාදයෙන් පැවැත්වේ.

වර්තමාන පූජා සහයක දරුවා සහ අනාගත පූජක පුතකු අතර ඇත්තේ බෙදා වෙන්කළ නොහැකි සම්බන්ධතාවයකි. ගරු පූජා ප්‍රසාදීන් වහන්සේලාගේ දේව කැඳවීම් ඉතිහාසයට එබිකම් කර බලන විට එකී දිගු ගමනේ පළමු පියවර පූජා සහයක අත්දැකීමයි.

මෙම කුළුඳුල් දෙව් පුද සේවා අත්දැකීම බොහෝ දෙනෙකුගේ දිගු ගමනක ආරම්භය වී ඇත්තේ දිව්‍ය පූජාවට, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට, දේවස්ථානයට ආදරයක් සහ කැපවුනු සේවයක් කුඩා කල සිට ඔවුන් ඔවුන්ගේ හදවත් තුළ ජනිත කරවමිනි.

මෙම සැඟවුනු සත්‍යතාවය මෙවර දෙව් පුද සේවා දිනයේදී ඇගයීමට ලක්කරමින් දේව කැඳවීම් බහුල කරවීමේ අදිටනින් කාදිනල්



*මෙම කුළුඳුල් දෙව් පුද සේවා අත්දැකීම බොහෝ දෙනෙකුගේ දිගු ගමනක ආරම්භය වී ඇත්තේ දිව්‍ය පූජාවට, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට, දේවස්ථානයට ආදරයක් සහ කැපවුනු සේවයක් කුඩා කල සිට ඔවුන් ඔවුන්ගේ හදවත් තුළ ජනිත කරවමිනි.*

හිමිපාණෝ පූජා සහයක දරුවන් හා සමඟ ඒ සුහාරංචිය බෙදා ගැනීමට තීරණය කර ඇත.

දෙව්සත්හල් දරුවන්ට ද සිය අත්දැකීම් ඔවුන් හා සමඟ බෙදා ගැනීමට උදාවන මෙම දිනය සැබවින්ම සුවිශේෂි වන බව නොරහසකි. ඒ නිසාම දෙව්සත්හල් දරුවන් මෙම දිනය සඳහා සූදානම් වන්නේ අප්‍රතිහත ධෛර්යයෙනි.

එම නිසා මෙම දිනයට බහුල ආශිර්වාදය පතා යාච්ඤා කරන මෙන් ගිහි පැවදි ඔබ සැමගෙන් ඉල්ලා සිටිමු.





ශා. ඇලෝසියස් දෙව්සත්හල් පරිසයට පැමිණි දහස් සංඛ්‍යාත පූජා සහයක දරුවන් ....

## කොළඹ අගරදගුරු පදවිය



බටගම ශු. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ දී දරු දැරියෝ 105 ක් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. මීසම් සේවක ගරු බර්නාඩ් නිශාන් විලත්ගමුව හිටපු මීසම් සහයක ගරු නලින් සුරාජ් පියතුමන්ගේ ද මඟ පෙන්වීම යටතේ මෙම කටයුතු සංවිධානය වු අතර දරු දැරියන් පුහුණු කරනු ලැබුවේ ගරු ඇනල්කා පැවදි සොහොයුරිය ප්‍රමුඛ දහම් පාසල් ආචාර්ය මණ්ඩලය විසිනි. දිව බොදුන් ලැබු ළමුන් ගරු පියතුමන් පැවිදි සොයුරිය හා දහම් ගුරු වරුන් සමග සමුහ සේයාරුවකට පෙනී සිටි අයුරු. ( **නිශාන්ත රෝසා** )

---



## හලාවත පදවිය

මාරවිල කනාක්ක දේව මාතා දෙව් මැදුරට අයත් දරු දැරියෝ සියයක් පසුගිය ද එම දෙව් මැදුරේදි පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. දේව මෙහෙය මාරවිල මීසම් සේවක ගරු ෆිලික්ස් කොළඹගේ සහයක ගරු දිලංක නිර්මාන් යන පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. දිව බොදුන් ලැබු ළමුන් ගරු පියතුමන්ලා, පුහුණු කළ ගුරු මෑණීවරුන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමුහ සේයා රුවකට පෙනි සිටි අයුරු. (**ෂම්මිකා ප්‍රනාන්දු** )

# තොඩුවාව මීසම් දරුවෝ මරිමව් යදිති





දිනෙන් දින ගිලිහෙමින් පවතින ජපමාල භක්තිය දහම් පාසල් දරුවන් මගින් පවුල් තුළට ව්‍යාප්ත කිරීම මූලික අරමුණු කර ගනිමින් ඥානාර්ථ ප්‍රදීපය මාධ්‍යවේදී ටෝනි නිශාන්ත ප්‍රනාන්දු මහත්මාගේ සංකල්පයකට අනුව ඇරඹූ ජපමාල දැහැන වැඩ සටහන් පෙළෙහි තවත් එක් වැඩසටහනක් පසුගියදා දවස පුරා තොඩුවාව සා. අන්තෝනි දෙව්මැඳුරේදී පැවැත්වුණි. මෙහි අනුශාසක වශයෙන් කිරිමැටියාන මීසම් සේවක ගරු අයිවන් පීටර් ප්‍රනාන්දු පියතුමා කටයුතු කරයි. මෙම අවස්ථාවට හලාවත පදවියේ විවාහ අධිකරණ කටයුතු භාර අති ගරු විමල්සිරි ජයසූරිය පියතුමන්ද සහභාගී වුණි.





මෙම වැඩපිළිවෙලෙහි සම්බන්ධීකාරක වශයෙන් ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා කටයුතු කරනු ලබයි.

තොඩුවාව මීසම් සේවක පියතුමන්ලා වන බෙනදිකාන නිකායික ගරු ඉයුජින් ද සිල්වා, දුෂාන්ත පෙරේරා දහම් ගුරුහවතුන් මයිකල් වර්ණකුල, ප්‍රියන්ත ප්‍රනාන්දු, තොඩුවාව මාරි නිලන්ති ප්‍රමුඛ ජපමාල ගී දැහැන ගායනා කණ්ඩායම මේ සඳහා සහයෝගය ලබාදුනි. මෙදින සහභාගිවූ සියලුම ළමුන්ට ජපමාලය නොමිලේ බෙදා දුනි. මෙදින අවස්ථාවන් මෙහි දිස්වේ.

**ලක්මාල් ඩයස්**

මාසික
සිතිවිල්ල



සේයා :- ටෙක්ලා කල්දේරා

**මාසික සිතිවිල්ල**

"ජුනි මාසය"

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## ශුද්ධ වූ සභාව

★ ශුද්ධ වූ සභාව යන්නට නිර්වචන තුනක් ඉදිරිපත් කරන්න

- ශුද්ධ වූ සභාව යනු දේව ජනතාවගේ සමාජයයි
- ශුද්ධ වූ සභාව යනු දේව රාජ්‍යයේ සමාජයයි
- ශුද්ධවූ සභාව, දේව ජනතාවගේ සාමාජීය ස්වභාවයන් දෙවි පියාණන්ගේ ගැළවීමේ සැලැස්ම සමඟ එක් කරනු ලබයි.
- ශුද්ධ වූ සභාව යනු කැඳවීමේ භාග්‍යය ලැබූ දේව ජනතාවයි, ශුද්ධ වූ ජනතාවයි.

★ ශුද්ධ වූ සභාව කරනු ලබන්නේ කුමක්ද?

- ශුද්ධ වූ සභාව, දේව ජනතාවගේ සාමාජීය ස්වභාවයන් දෙවි පියාණන්ගේ ගැළවීමේ සැලැස්ම සමඟ එක් කරයි.

★ ශුද්ධ වූ පාවුළුතුමා කොරින්තිවරුන්ට යැවූ පළමු හසුන අනුව ශුද්ධ වූ සභාව සමාන කරන්නේ කුමකටද?

- බොහෝ අවයව තිබුණත්, අවයව විවිධාකාර වුවත් , එකම ශරීරයකටය



## දිව්‍ය සත්ප්‍රසාදය

★ දිව්‍ය සත්ප්‍රසාදය යනු කුමක් ද?

- පූප ප්‍රකාරයෙනුත්, මිදි රස ප්‍රකාරයෙනුත් ජේසු සමිඳුන්ගේ සිරි සිරුරත්, සිරි ලෙයත් (ශ්‍රී ශරීරයත්, ශ්‍රී රුධිරයත්) ආත්මයත් දෙවීකයත් අඩංගු වී තිබෙන දේව ප්‍රසාද නිධානය, දිව්‍ය සත්ප්‍රසාදය වන්නේ ය.

- දිව්‍ය සත්ප්‍රසාදය ප්‍රසාද නිධානයක් වන අතරම යාගයක් ද වන්නේ ය.
- පූප හා මිදිරස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය සහ ශ්‍රී රුධිරය බවට පරිවර්තනය වීම, මූලද්‍රව්‍ය පරිවර්තනය නම් වේ.

★ දිව්‍ය සත්ප්‍රසාදය ප්‍රසාද නිධානය හඳුන්වන තවත් නාමයන් 04 ක් ලියා දක්වන්න.

- තුති දීමේ පිළිවෙතකි.
- ස්වාමින් වහන්සේගේ භෝජනය
- සහභාගිකමේ භෝජනය
- පූප කැඩීම

★ ''ප්‍රසාද නිධානයන්ගේත් ප්‍රසාද නිධානය '' යන නමින් අද්විතීය ස්ථානයක් ගන්නේ කුමන ප්‍රසාද නිධානය ද?.

- දිව්‍ය සත්ප්‍රසාදය ය.

★ ක්‍රිස්තියානි ජීවිතයේ උල්පත සහ මුදුන්මල්කඩ කුමක් ද?

- දිව්‍ය සත්ප්‍රසාදය.

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

★ ක්‍රිස්තුන් වහන්සේ එකට හිඳ ආහාරගත් අවස්ථාව නම් කරන්න.

- කානා නුවර විවාහ මංගල්‍යය
- පරිසිවරයකු වූ සයිමන්ගේ ගෙදර ආහාර ගැනීම
- මාර්තා - මරියාගේ ගෙදර ආහාර ගැනීම
- පාළුකරයේ පන්දහසකට ආහාර දීම
- සකේවුස් නමැති අයබදු අය කරන්නාගේ ගෙදර ආහාර ගැනීම



# ශා. ඇලෝසියස් ගොන්සාගා මුනිතුමා.

**ඉතා නිහතමානි ලෙස දෙව්සත්හල් සමයේ දී තමාට ලද වගකීම් හා යුතුකම් නිසි ලෙස වේලාවට කරන්නට හුරුපුරුදුවූ එතුමා දිළිඳු දිවියක් ගත කරනු අටියෙන් පරණ වැරහැලි ඇඳිමින් තමා සතු අඟනා වස්ත්‍ර දිළිඳුන්ට බෙදා දුන්නේය.**

අසේල දසනායක

ඉතාලියේ රෝම පුරවරයේ ආදිපාදවරයකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටි ෆර්ඩිනන්ඩ් ගොන්සාගා හා මාර්තා සන්ටේනා යන යුවලට දාව ක්‍රි.ව. 1568 මාර්තු 09 දින පවුලේ කුළුදුල් දරුවා ලෙස උපන් මෙතුමාගේ නාමය වුයේ 'ඇලෝසියස් ලුයිජි'' ගොන්සාගා යන්නයි. කුඩා කල සිට මවගෙ න් ලද ආගමික බැතිය හා දෙවිඳුන්ට යටත් පහත් බව නිසා ම කුඩාකල සිටම ධාර්මික දිවිපෙවතක් කෙරේ භක්තිය හා දේවමාතා බැතිය මෙතුමා තුළ රෝපණය වී තිබුණි.

තම පුතණුවන් කෙරේ වූ අනාගත අරමුණ ලෙස මෙතුමාගේ පියා සිහින මවමින් සිටියේ වීර සෙබලකු ව සිටී වී කියාය. මේ නිසා ම ක්‍රි.ව. 1572 දී සෙබලුන් පුහුණු කිරීමේ කටයුතු සඳහා කසාලේ නුවරට සිය පියා සමඟ මෙතුමා ගිය අතර, එහි දි අවි , ආයුධ පාවිච්චියට ද පියාගෙන් අවසර ලැබුණි. මෙහිදි කුඩා ඇලෝසියස් ද තමන් තුළ සැඟවී තිබුණ විර හැකියාවන් ඔප මට්ටම් කර ගැනීමට ද සමත් වූ අතර, දිනක් පුහුණු වීම් වලදි ඇලෝසියස්ගේ අත්වැරදීමකින් වෙනත් අයෙකු තුවාල ලැබීය. ඉන් ලැජ්ජාවට හා බියට පත් වූ ඔහුගේ පියා තම පුතුට තුවක්කු හා අවි ආයුධ භාවිතය තහනම් කරන ලදි.

එහෙත් කෙළිලොල් වියේ පසුවූ ඔහු සෙබලකු නිදා සිටිය දි අවිය සොරකම් කිරීමට ගොස් හසුවීම නිසා කසිටි ලියෝනයට එවීමට සිදුවිය. ක්‍රි.ව. 1577 දී ඉතාලිය පුරා මහාමාරියා වසංගතය පැතිර ගිය නිසා ඇලෝසියස් හා ඔහුගේ සොයුරා ද පියාගේ මිතුරකුගේ නිවසේ නතර කරන ලද අතර, කුඩා කල සිටම තමා අතින් සිදුවූ අතපසු වීම් වලට මනස්ථාපනය වන්නට මෙහිදි එතුමන්ට හැකි විය. වයස අවු 9 ක් වූ කල ඔහු ප්‍රථම වරට සමගි සන්ධානය ලැබූ අතර, උසස් අධ්‍යාපනය ලබනු අටියෙන් ෆලෝරන්ස් නුවරට යවනු ලැබූ අතර, ක්‍රි.ව. 1579 දී තම සොයුරා සමගින් මන්ටුවාවට වැඩිදුර අධ්‍යාපනය සඳහා යවන ලදි. මේ කාලයේදී දිනක් අහම්බෙන් මෙන් ශු. චාල්ස් බොරොමියෝ මුනිතුමාව එතුමන්ට මුණ ගැසිණි. එහි දි එතුමා දෙසූ දේශනාව ඇලෝසියස්ගේ සිත් ගත්තේය. මේ දේශනාව නිසා එදිනම ප්‍රථම වරට එතුමා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්තේය.

ඔහුට අවු 13 ක් පිරුණු කල පැවිදිවරයකු විමේ ඇඩි ආශාවක් ඇති විය. එහෙත් පියා තුළ ඔහු කෙරෙහි වූ අනාගත සිහිනය නිසා මෙම අරමුණට පියා ඉතා තදින් ම විරුද්ධ විය. එහෙත් නොසැලෙන අභිත දේව කැඳවීමට හිස නමා, බාධක කරදර මධ්‍යයේ වුවද නොසැලි පියාගෙන් උරුම වන්නට තිබූ තාන්න මාන්න, ධන සැප සම්පත් ප්‍රතික්ෂේප කොට ක්‍රි.ව. 1585 නොවැම්බර් 25 වන දින රෝමයේ ජේසු නිකායික දෙව්සත්හලට ඇතුළු විය.

මේ වන විට එතුමාගේ වයස අවු 18 කි. ඉතා නිහතමානි ලෙස දෙව්සත්හල් සමයේ දී තමාට ලද වගකීම් හා යුතුකම් නිසි ලෙස වේලාවට කරන්නට හුරුපුරුදුවූ එතුමා දිළිඳු දිවියක් ගත කරනු අටියෙන් පරණ වැරහැලි ඇඳිමින් තමා සතු අඟනා වස්ත්‍ර දිළිඳුන්ට බෙදා දුන්නේය. දිනපතා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීමෙන් තෘප්තිමත් වූ මෙතුමා ක්‍රි.ව. 1587 නොවැම්බර් 28 වන දින ජේසු නිකායේ සාමාජිකයකු ලෙස වේද භාර දෙන ලදි. ක්‍රි.ව. 1591 දී රෝමයේ දරුණු වසංගතයක් හා සාගතයක් ඇති විය. මෙහිදි පීඩාවට පත් රෝගීන්ට ඇප උපස්ථාන කිරිමට ජේසු නිකායික පියවරු පෙරමුණ ගෙන ක්‍රියා කළෝය. මේ තුළින් ඇලෝසියස් තම මුළු කාලය හා ශ්‍රමය දිළිඳුන් උදෙසා ඇප කැප කරන්නට වෙර දැරීය. සැම දෙනාම පිළිකුල් කරන ලාදුරු රෝගීන්ගේ පවා වණ සෝදා පවිත්‍ර කිරීමට තරම් හේ බැහැපත් විය. මේ වසංගත හේතුවෙන් ම ක්‍රි.ව. 1591 මාර්තු 03 වන දින රෝගි තත්වයට පත් වූ ඇලෝසියස් ද, මෙකී වසංගත උණ රෝගයට ගොදුරු වී, හැකි සැම විට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්තේය.

ක්‍රි.ව. 1591 මාර්තු 21 වන දින ඔහුට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හා අන්තිම ආලේපනය ලබා දුන් අතර ටික දිනකින් ඔහුගේ රෝගි තත්වය සුව අතට හැරිණි. ක්‍රි.ව. 1591 ජුනි මස 20 වන දින නැවත වරක් අසාධ්‍ය ලෙස රෝගාතුර වූ මෙතුමා 'පියාණෙනි මාගේ ආත්මය ඔබගේ හස්තයට භාර දෙමි'' යැයි පවසමින් ස්වර්ගස්ථ විය. ක්‍රි.ව. 1621 දී xv වන ග්‍රෙගරි පාප්තුමා විසින් භාග්‍යවරයට ද 1726 දෙසැම්බර් 31 වන දින ශුද්ධවරයට ද මෙතුමාව ඔසවන ලදි. මෙතුමාගේ මංගල්‍යය ජුනි 21 වන දින සමරන අතර කතෝලික යෞවනයන්ගේ ද පූජාසභයක දරුවන්ගේද නාම සාන්තුවරයා ලෙස මෙතුමා ශු. සභා මාතාව ගෞරවාභිමානයෙන් සලකන්නිය.

**මේ ජූනි මාසය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී හෘදයට කැප කර ඇති බැව් පුංචි ඔබ දන්නවා නේද ? මේ නිසාම ජේසුස් වහන්සේ ගේ ශ්‍රී හෘදයේ මංගල්‍යය පෙන්තකොස්ත ඉරුදිනට පසුව පැමිණෙන තෙවැනි සිකුරාදා දිනයේදී හෙවත් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ මංගල්ලයට පසු පැ-මිණෙන අෂ්ට කයේදී පැවැත්වේ**

සැබෑ දෙවියන් මෙන්ම සැබෑ මනුෂයාද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අපරිමිත වුත්, නිමා නොවන්නාවුත් ප්‍රේමය උන්වහන්සේගේ දිව්‍ය හෘදයෙන් සංකේතවත් කැ-රෙන නිසා කතෝලික අපි උන්වහන්සේට වන්දනා නමස්කාර කරමු.



සා. මහා ඇල්බට්

දිව්‍ය හෘදයේ භක්තියේ ආරම්භය සහා පිය යුගයන් හා බැඳී පවතී. සා. කැන්ටබරියේ ඇන්සලම්, සා. මහා ඇල්බට්, සා. බොනවෙන්චර් වැනි මධ්‍යතන යුගයේ විසූ සාන්තුවර පඬිවරුන්ද, 13 හා 14 සියවස් වල දිවි ගෙවූ මැජබැර්ග්හි මෙන්ටිල්ඩ්, හෙල්ෆ්ටාහි ගර්ට්රෑඩ්, හෙන්රිච් සෙඋස් වැනි යෝගාවචර තාපස, තාපසිකාවන්ද දිව්‍ය හෘදයේ භක්තිය කෙරේ නැඹුරු විය.



කැන්ටබරියේ සා. ඇන්සලම් මුනි

14 වැනි සියවස අවසාන භාගයේ නෙදර්ලන්තයේ ගේහාට් ග්‍රෑටගේ නවෝදයේ ව්‍යාපාරයත්, ජේසු නිකායික පූජා ප්‍රසාදිවරුන්ද දිව්‍ය හෘදයේ භක්තිය ප්‍රචලිත කරන්නට මහත් වෙහෙසක් ගෙන කටයුතු කළ බැව් නොරහ-සකි. ප්‍රංස ජාතික ඔරතෝරියානුවන් වු පියෙර බෙරුළ් සහ සා. ජෝන් යුඩ්ස් මුනිතුමා 17 වැනි සියවසේ දි දිව්‍ය හෘදයේ භක්තිය ප්‍රචලිත කිරීමට මහත් වෙහෙසක් ගත්හ. 1672 ඔක්තෝබර් 20 දා සාන්ත ජෝන් යුඩ්ස් මුනිතුමා තමන්ගේ ඔරතෝරියානු පැවිදි සංඝය තුළ පළමුවරට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දිව්‍ය හෘදයේ මංගල්‍යය පැවැත්විය.

වර්ෂ 1673 හා 1675 කාලයේදි ප්‍රංශයේ විසිටේෂන් නිකායේ ගරු මාගරට් මේරි ඇලකොක් (මර්ගරීතා මරිය තුමිය) පැවිදි සොයුරිය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දර්ශනය කරන්නට වරම් ලැබුවාය. එහිදී දිව්‍ය හෘදයේ මංගල්‍යයක් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ මංගල්‍යයට පසුව අෂ්කටයේ ආරම්භ කරන ලෙසත්. සිකුරාදා දිනවල දිව්‍ය හෘදයේ



# ජුනි සැම සිරිහද



# මස
# රෙන
# බැතිය

කිතුනු උරුමය



හෙල්ෆ්ටාහි සා. ගර්ට්රූඩ් තුමිය

ශුද්ධවූ පැය ඇතුලු යැදුම් කරන ලෙසත් එතුමියට ක්‍රිස්තුස් වහන්සේගෙන්ම පණිවුඩ ලැබුණි.

මේ දර්ශනයන් මෙන්ම එළිදරව් හා ඉල්ලීම් ශුද්ධවූ සභාව එක්වර පිළි ගත්තේ නැත. සිද්ධියට සියවසක් ගත වන්නට සමීප සමයේදී එනම් 1765 දී අති උත්තම දස තුන් වැනි ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා මීට අවසර ලබා දුන්නේය. ඒ අනුව පෝලන්ත ජාතික රදගුරු හිමිපාණන්ට සහ දිව්‍ය හෘදයේ රෝමානු සභෘද සංගමයට දිව්‍ය හෘදයේ මංගල්‍යය පැවැත්වීමට මුල් වරට අවසර ලබා දුන්නේය. වර්ෂ 1856 දී අති උත්තම නමවැනි පියුස් සසුනිසුරාණෝ දිව්‍ය හෘදයේ මංගල්‍යය ශුද්ධවූ සභාවේ මංගල්‍යයක් ලෙස නිර්දේශ කළහ.

1899 දී අති උත්තම දස තුන් වැනි ලියෝ ශුද්ධෝත්තම පියතුමා දිව්‍ය හෘදයේ මංගල්‍ය ප්‍රධාන මංගල්‍යයක් ලෙස උසස් කැර මුළු ලෝකයම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී හෘදයට කැප කළේය. වර්ෂ 1927 අති උත්තම එකොළොස් වැනි පියුස් ශුද්ධෝත්තම පියතුමා මංගල්‍යයට නියමිත දේව වන්දනා පිළිවෙත ප්‍රතිශෝධනය කළ අතර 1956 දී දිව්‍ය හෘදයේ මංගල්‍යය විශ්ව සසුන් මංගල්‍යයක් වීමේ ශත සංවත්සරය නිමිති කර අති උතුම් දොළොස් වැනි පියුස් ශුද්ධෝත්තම පියතුමා හරියේටිස් අක්වාස් නමින් විශ්ව ලේඛනයක් නිකුත් කළේය.

අතිඋත්තම එකොළොස් වැනි පියුස් ශුද්ධෝත්තම පියතුමා 1928 දී පෞද්ගලිකව මැදිහත්ව මේ මංගල්‍යය සඳහා තෝරාගත් ශුද්ධ ලියැවිලි පාඨ අද දක්වා පවතී, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දිව්‍ය හෘදයට කතෝලික නිවාස කැප කිරීම මෙරට පුරා ඉතා ප්‍රචලිත සිරිතකි.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දිව්‍ය හෘදයේ ප්‍රේමය නිරතුරු අත්දකින්නට පුංචි ඔබත් සූදානම්ද ?

ශිරාන් මෛත්‍රි



මර්ගරිතා මරිය තුමිය

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 57**

## So and Such

මෙම වාක්‍ය වලදී "that" යන සම්බන්ධීකරණ වචනය අවශ්‍ය නම් නොදා ඉන්නත් පුළුවන්. වැකියේ අර්ථයට හානියක් වෙන්නෙ නෑ.

Anil was so angry (that) his face was as red as an apple.

අනිල්ට කොච්චර තරහ ගිහින් තිබුනද කිව්වොත් එයාගෙ මූණ ඇපල් ගෙඩියක් වගේ රතුවෙලා තිබුණා.

⋆ "එතරම්" කියන සිංහල වචනය පිළිබිඹුවන ලෙසටත් අපට "so" යොදන්න පුළුවන්.

He is 70 years old. But nobody can say he is so old.

(හී ඉස් 70 ඉයර්ස් ඕල්ඩ්. බට් නෝ බොඩි කැන් සේ හි ඉස් සෝ ඕල්ඩ්) ඔහුට වයස අවුරුදු 70 ක්. ඒත් කාටවත් කියන්න බෑ ඔහු ඒ තරම් වයසයි කියල.

Someone told me that this building is 100 years old.
But I didn't know that it was so old.

මේ බිල්ඩිම අවුරුදු 100 ක් පැරණියි කියල කවුද කිව්ව. ඒත් ඒක ඒ තරම් පරණයි කියල මම දන්නෙ නෑ.

Today I got up at 4.30. But usually I don't get up **so** early.
මම අද නැගිට්ටෙ උදේ හතරට.
ඒත් සාමාන්‍යයෙන් මම එච්චරම උදේ නැගිටින්නෙ නෑ.

The Car was more than 500,000/- I didn't have **so** much of money.
ඒ කාරෙක ලක්ෂ 5 කට වැඩියි. මට ඒ තරම් මුදලක් තිබුනෙ නෑ.

I didn't know it was so far.
මම දැනගෙන හිටියෙ නෑ ඒක එච්චර දුරයි කියල.

නමුත් so far, කියන වචන දෙක වෙන අරුතක් සඳහාත් යොදනවා. ඒ "තවමත්" කියන අදහස සඳහා)

so far, I didn't receive that letter. (සෝ ෆාර් අයි ඩිඩ්න්ට් රිසීව් දැට් ලෙටර්) තවමත් මට ඒ ලිපිය ලැබුණෙ නෑ.

Nobody informed me so far. (නෝබොඩි ඉන්ෆෝම්ඩ් මී සෝ ෆාර්) මෙතෙක් මට කිසිවෙක් දැනුම් දුන්නෙ නෑ.

Things are so good so far. (තිංග්ස් ආ(ර්) සෝ ගුඩ් සෝ ෆා(ර්))
සියල්ල මෙතෙක් නම් ඉතා හොඳයි.

There was so much traffic. That's why I am late.
(දෙයාර් වෝස් සෝ මච් ට්‍රැෆික් දැට්ස් වයි අයි ඇම් ලේට්)
අද හරි "ට්‍රැෆික්" ඒකයි මං ප්‍රමාද වුණේ.

She has to do so many things before she leaves for India.
(ෂී හැස් ටු ඩූ සෝ මෙනි තින්ග්ස් බිෆෝ ෂී ලීව්ස් ෆො ඉන්ඩියා) ඇය ඉන්දියාවට යෑමට කලින් ඇයට බොහෝ දේවල් කරගන්න තියෙනවා.

I have told him so many times not to take liquor.
(අයි හැව් ටෝල්ඩ් හිම් සෝ මෙනි ටයිම්ස් නොට් ටු ටේක් ලිකර්)
මත්පැන් ගන්න එපා කියල මම ඔහුට කීප වතාවක්ම කියල තියෙනවා.

I waited in the queue for one hour.
I didn't think that it would take so long.
(අයි වෙයිටඩ් ඉන් ද කිව් ෆො වන් අව(ර්) අයි ඩිඩ්න්ට් තින්ක් දැට් ඉට් වුඩ් ටේක් සෝ ලෝන්ග්) මම පැයක් කිව් එකේ සිටියා එච්චර වෙලා යයි කියලා මම හිතුවෙ නෑ.

## ශා. පීතර විදුහල - උඩුගම්පොළ ශාඛාව



උඩුගම්පොළ ශා. පීතර විදුහල් ශාඛාවේ වාර්ෂික මැයි මංගල්‍යය පසුගිය දා පැවැත්වුණි. විදුහල්පති ගරු චමින්ද වනිගසේන පියතුමා හා ගම්පහ ශාඛාව භාර ප්‍රදීප් කුමාර පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම දිව්‍යයාගයෙන් පසුව දේවමාතා ප්‍රතිමාව රැගත් පෙරහැර පාසල් භූමිය වටා විදී සංචාරය කළ අයුරු ළමා ප්‍රදීපය කැමරා කාචයේ මෙසේ සටහන් වුණි. **අසේල දසනායක**




## රත්මලාන රෝමානු කතෝලික විදුහල

රත්මලාන රෝමානු කතෝලික විදුහලේ මැයි මංගල්‍යය සැමරීය. පාසල් භූමියේ දේවමාතා ප්‍රතිමාව හා ශු. බයිබලය පෙරටුකොට පෙරහැරකින් ගමන් ගත් අතර මෙහිදි දේවමාතා ගුහාව අසල ජපමාලය හා ප්‍රාර්ථනාව උච්චාරණය කළහ. මෙම අවස්ථාවට විදුහල්පතිනිය ඇතුළු ආචාර්යමණ්ඩලය ඇතුළු දරුවන් සහභාගි වූහ. **අසික ප්‍රියදර්ශන**



## බටගම මීසමේ ධර්මදූත ළමෝ පදක්කම් පළඳති.



බටගම මීසම තුළ, ධර්මදූත ළමා සමාජ වල දරුවන් 150 දෙනෙකුට, ධර්මදූත ළමා සමාජයේ ස්ථිර සමාජිකත්වය ලැබීමේ, පළඳනා ප්‍රදානය පසුගියදා සිදු කෙරිනි. බන්ඩිගොඩ, ඉඳිමින්න, කපුවාගාර සහ බටගම දරුවන් මෙයට අයත් වේ. මෙම අවස්ථාව ධර්මදූත පදවි අධ්‍යක්ෂ ගරු කිත්සිරි තිරිමාන්න පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. බටගම හිටපු මීසම් සහයක ගරු නලින් සුරාජ් පියතුමා මෙම කාර්යයට ප්‍රධානත්වය දී කටයුතු කළේය. **දිලිප් චතුරංග**

## බණ්ඩාරවෙල සා. අන්තෝනි දහම් පාසල




දහම් පාසල් අරමුදල වෙනුවෙන් ළමා පොළක් බණ්ඩාරවෙල මීසම් සේවක ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු පියතුමාගේ උපදෙස් මත පසුගිය දා බණ්ඩාරවෙල සා. අන්තෝනි මුනි දහම් පාසලේ පැවැත්වුණි. දරු දැරියෝ තමන්ගේ නිවසින් නෙලාගත් එළවළු, පලතුරු හා පිළියෙල කරන ලද කැවිලි වර්ග ද රැගෙන ආහ. මේවා මිළදී ගනිමින් මීසම් වාසී ජනතාව මේ සඳහා විශාල සහයෝගයක් ලබාදුනි. **බී.ඒ. මනෝජ් දිවංක**

**ඔබේ දහම් පාසල ගැන අපිට ලියලා එවන්න ...**

**ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්යය මණ්ඩලය හා සිසු නායකයින්ගේද සේයාරූ සමඟ අප වෙත යොමු කරන්න.**

**අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**



**පරිසරයේ අසිරිය**
**උදාර චන්දිම විරරත්න**
06 ශ්‍රේණිය
ශ්‍රී හෘදයේ දහම් පාසල - කටුගස්තොට

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**චිත්ත මෝස්තරය**
**ට්‍රෙවෝන් ශෙනන්**
05 ශ්‍රේණිය
මාරිස් ස්ටෙල්ලා විදුහල - මීගමුව



**දිය ඇල්ලක්**
**යමේෂා දේවින්දි ප්‍රනාන්දු**
05 ශ්‍රේණිය
සාන්ත මරියා ප්‍රාථමික බාලිකා විදුහල
හලාවත



**ශුද්ධවූ ත්‍රිත්වය**
**දිල්ෂාන් සම්පත් ප්‍රනාන්දු**
12 ශ්‍රේණිය
සාන්ත ක්රේෂියානු දෙව්සත්හල
කොච්චිකඩේ



**අපගේ මිදුම්කරුවාණෝ**
**තිළිණ දිල්ශාන් ප්‍රනාන්දු**
06 ශ්‍රේණිය
සාන්ත ජෝශප් දහම් පාසල - මැදවච්චිය





**අපේ දිව්‍ය භෝජනය**
**උදාරි විශ්ෂිකා ඩිමෙල්**
04 ශ්‍රේණිය
ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාමය
මොරටුව



**ජේසුගේ දිව්‍ය හෘදය**
**ක්‍රිෂ්නි ඇන්තනීස්**
04 ශ්‍රේණිය
ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය - කොළඹ 07



**සා. ජුසේවාස් මුනිතුමා**
**අශාන් ශානුක**
08 ශ්‍රේණිය
ශු. විනිප්‍රීඩා මුනිවරියගේ දහම් පාසල
හාල්දඬුවන මීසම



# බයිබලයයි පුංචි මමයි

ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමන් විසිනි

දයාබර දුවේ පුතේ,

මෙවර ද ඔබත් සමඟ කතා කරන්නේ හිතෝපදේශය නැමැති ප්‍රඥාව පිරි බයිබලීය පොත මූලික කරගෙනය.

"තමන්ගේ කිලිටි ගති සෝද නොදමා , තමන් පවිත්‍ර යයි සිතන මිනිසුන් ඇත."

ඉහත කියමන හිතෝපදේශයේ 30 වන පරිච්ඡේදයේ 12 වන වගන්තියෙන් උපුටා ගත් එකකි. අපි මිනිසුන් වශයෙන් ඉතා හොඳ ගතිගුණ තිබෙන අයය. එහෙත් අපි කා අතරත් යම් අඩුපාඩුකම් හා පව්කාරකම් ද තිබෙන බව මතක තබා ගත යුතුය. අපේ අඩුපාඩු හද ගන්න අපි නිතරම මහන්සි විය යුතුය. ඔබේ අම්මා තාත්තා ගුරුවරු ඔබේ අඩුපාඩුකම් වැරදි නිවැරදි කරන විට ඔබ ඒවා නිහතමානිව පිළිගන්නවාද?



සමහර විට ඔබට ඔබේ දෙමාපියන් ගුරුවරුන් එක්ක කේන්ති යනවා විය හැකිය. නමුත් ඔබේ අඩුපාඩු පුංචි කාලේ ඉඳලම හද නොගත්තොත් ඔබ ලොකු වන විට ඒවා නිවැරදි කිරීම බොහෝ අපහසුය.
එවිට ඔබ හිතන්නේ ඔබ කිලිටි නැතැයි කියාය ඔබගේ පවිත්‍ර බව හොඳ බව ආරක්ෂා කර ගැනීමට නම් මුලින්ම ඔබේ ජීවිතයට හැරිලා බලන්න.

ඔබට නොපෙනෙන බොහෝ දේ ඔබේ දෙමව්පියන්ටත් ගුරුවරුන්ටත් වැඩිහිටියන්ටත් පෙනෙන බව මතක තබා ගන්න.

ඒ නිසා නිහතමානිව ඒ අය හා සමග ඔබව පවිත්‍ර කරගන්නටත් නිවැරදි කරගන්නටත් කඩිනම් වන්න.

# රාත්‍රිය



රාත්‍රියේ දිලෙනා අහසේ තරු මල්
පොකුරු පොකුරු ගෙනත් නිහ්ඬ කමින්
හඳ මාමා එබී බලන නිහ්ඬ රාත්‍රියේ
සඳ තරු මල් හිනා වෙවී එබී බලන්නේ

පාවෙලා ඇවිත් සිසිල නිසරු ලෙසින්
එනමුදු පායන තරු සඳ ගාවින්
ලාලිත සඳ රැස් හිමින් හිමින් නිල්වන් අහස දෙ බලා
පෙනෙන නොපෙනෙනා දුරක ඉඳන්
අප හඳටද ඇවිත් හොරෙන්
රුවන් දෑල හොරෙන් බලා රහස් පවසනවා

සචිනි යශෝධර
9 ශ්‍රේණිය
ශා. විනිප්‍රීඩා දහම් පාසල - කහටවිල , හාල්දඩුවන මීසම

# මම සරුංගලයක් නම්



මම සරුංගලයක් නම් ඈත තිබෙන ආකාසයේ පාවීමට වාසනාව තිබේ. ඒ අතරම මුහුදු වෙරළේ තිබෙන සුන්දරත්වය නැරඹීමටද මට හැකිවේ. මම සරුංගලයක් නම් මට ලස්සන පටිද ලස්සන පාටද තිබේ. පුළුවන් තරම් උඩ ගොස් ළමුන්ගේ සතුට දෙගුණ තෙගුණ කරන්නටද මට හැකිවේ. අහසේ පියා සලන කුරුල්ලන් සමඟ තරග පැවැත්වීමටද මට හැකි වේ. අනික් සරුංගල් දෙස ආඩම්බරයෙන් බලා පාවීමටද මට හැකි වේ.

මම සරුංගලයක් නම් මා අයිති ළමයාට කීකරුව සිටීමටද ඇයගේ සෙනෙහස ලබා ගැනීමටද මට පුළුවන් වේ. මම සරුංගලයක් නම් යාළුවන් සමඟ අහසේ පාවී පාවී සෙල්ලම් කිරීමටද මට හැකි වේ. මා කැමති අන්දමකට පාවීමට, ඉහළට යාමට මට හැකියාවක් ඇත. මම සරුංගලයක් නම් මා වඩාත් නයාගේ ස්වරූපයට සිටීමට කැමතිය. අවසාන වශයෙන් මට කීමට තිබෙන්නේ මා සරුංගලයක් නම් මට විඳීමට තිබෙන උපරිම සතුට මා ලබා ගන්නා බවය.

මිනාෂා සිල්වා
5 ශ්‍රේණිය
ශු. පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය.




## කොටිකාවත්ත ශා. තෙරේසා දහම් පාසල



කොලොන්නාව මීසමට අයත් කොටිකාවත්ත අවිලාහී ශු. තෙරේසා මුණිවරියගේ දෙව්මැදුරේ දහම් පාසලේ සිසු නායක නායිකාවෝ පසුගිය ද ශිෂ්‍ය නායක පදක්කම් පැළඳුහ.

කොලොන්නාවේ හිටපු මීසම් සේවක ගරු රුවන් රීඩ් ලියනගේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පදක්කම් පැළඳී සිසු නායක නායිකාවන් ගරු පියතුමා සමග ළමා ප්‍රදීපය සේයාරුවකට පෙනීසිටි අයුරු. **ආර්. ජෝශප් ප්‍රිය.**

## දිව්‍ය හෘදයේ ජේසුනි



ඔබට කැප වී ඇති මාසය ජුනි මාසයයි
ඔබ වෙනුවෙන්මයි ඇත්තේ ජේසු සමිඳුනි
පිරී යන්නේ අප හදවත් කිතු බැතිනි
නිරතුරු ඔබ වෙනුවෙන් ජීවත් වෙමු
අබ්බා පියාණනි.

පුංචි අපේ ළමා ලෝකය
ඇල්වුව මැන අප ජීවිත තුළ ආලෝක
සැමවිට ඔබේ වදන් අසන්නට
කැපවෙමු අපි සියලු දෙනා ඔබ වඳින්නට

ජේසු සමිඳුනි
දුරුකළ මැනව
ලෝක අන්ධකාරය
ජේසු සමිඳුනි කැපවෙමු අපි
සියලු දෙනා ඔබ වඳින්නට

**මියාරා රොද්‍රිගු**
04 ශ්‍රේණිය
ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය - කොළඹ 07

## ප්‍රහේලිකා අංක 31



( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )

**පහළට**

1. මෙම දිවැසිවරයා යාච්ඤා කළ විට වැසි වැස, තුන් අවුරුද්දක් රට පුරා පැවති නියගය කෙළවර විය.

2. සීනයි කන්දේදී දෙවියන් වහන්සේ විසින් මෝසෙස් තුමාට මෙය දෙන ලදී.

3. මෝසෙස් ප්‍රමුඛ ඊශ්‍රායෙල් ජනතාවට ගමන් කරනු සඳහා දෙවියන් වහන්සේ මෙම මුහුද දෙබෑකර එය මැදින් වියලි බිමක් සෑදූ සේක.

4. ''ඔබේ පැද වලින් ...... ගළවා දමන්න. ඔබ සිටින ස්ථානය ශුද්ධ භූමියකි'' දෙවියන් වහන්සේ මෝසෙස්ට වදාළ සේක.( මෙහි හිස්තැනට සුදුසු වචනය

6. දෙවියන් වහන්සේ , ඊශ්‍රායෙල් ජනතාව කාන්තාරය මැදින් ගමන් කරන විට ප්‍රාතිහාර්යකින් මේවා ලබා දුන් සේක.

7. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ අවස්ථාවලදී මොවුන් වැහී සිටි අයට සුවය ලබා දුන් සේක.

**හරහට**

1. ශු බයිබලයේ අවසාන පොතේ නම ..........

5. ක්‍රිස්තුන් වහන්සේ ධනවත් ප්‍රධානියාට කථා කොට ''ඔබ... ..සියල්ල විකුනා දිළිඳුන්ට දෙන්න. එවිට ස්වර්ගයෙහි ඔබට සම්පත් ඇති වන්නේය'' වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ක්‍රිස්තුන් වහන්සේ මහා.......... කට සුවසෙත උදාකළ බව ශු. මතේව් තුමා පවසයි. හිස්තැනට සුදුසු වචනය

8. මරිය තුමිය ක්‍රිස්තුන් වහන්සේව ......... දරා සිටියාය. හිස්තැනට සුදුසු වචනය

9. යාච්ඤා කිරීම සඳහා දේව මාලිගයට ගිය අයකැමියා තම .......ට ගසා ගනිමින් ''දෙවියන් වහන්ස පව්කාරවූ මා හට කරුණා කළ මැනව ''යි කීය. හිස්තැනට සුදුසු වචනය.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ජුවාම් 19, ශු. ලූක් 18, ශු. මතේව් 4, 1රාජාවලිය 17,18, නික්මයාම 3,18,14,)


කුමාරවරු හරිම විනෝදෙන් කාලය ගතකළා. කොච්චර විනෝද වුනාද කිව්වොත් තමන්ට යන්න ඕන පළාතිවත් සොයාගන්න බැරුව මුහුද මැද්දෙ අතරමං වුනා...!
දැන් ඉතිං කරන්න දෙයක් නෑ.. ඒත් ඒ ගොල්ලො හොඳට කාලා බීලා නටලා විනෝද වෙනව..
රජ කුමාරයයි කිඳුරු කුමාරියි
නැංගුරම් දලා නැව මුහුද මැද්දෙනතර කර ගත්තා..! අද නම් සුළඟත් සැරයි.. කුණාටුවක් එන්න වගෙයි. නැව එහාට මෙහාට පැද්දෙන්න ගත්තා.! මේ කොච්චර දෙයක් සිද්ධ වුනත්.. කුමාරවරුන්ටනම් කිසි ගානක් නෑ
2
ආනන්ද කල්දේරා රචනා කරයි..
දැන් ඉතිං ඉරත් බැහැලා රෑ වෙන්නත් ආවා..! කළුවර වැටීගෙන එනකොට පළාතම මීදුමෙන් වැසුනා..! මුහුද එන්න..එන්නම සැරවුනා..! දැන් රාත්‍රී දෙළහ විතර වෙන්නත් ආවා..! තව තවත් වේගෙන් සුළං හමන්නත් විදුලි කොටලා අකුණු ගහන්නත් පටං ගත්තා...
දෙබස් සහ චිත්‍ර.. ඇස්.ඒ.පී. සමරආරච්චි
මුහුදේ රළ අහස තරම් උසට නැගුනා.. නැව නදින්ම එහාට මෙහාට පැද්දෙනකොට තමයි.. කුමාරවරුන්ට මතක් වුනේ.. අපි මුහුද මැද අතරමංවෙලයි ඉන්නෙ කියලා
කුමාරවරුන්ට කාවදුවන්න එහෙම දෙයක් වෙලා නෑ.! ඒ ගොල්ලො හොඳටම බයවෙලා මුහුද දිහා බලාගෙන හිටියා..!
රාත්‍රී දෙළහ පහුවුනාට පස්සෙ මුහුද ටික ටික.. හොඳ අතට හැරුනා..! මේ වෙලාවෙ සිතුන්නවත් බැරි දෙයක් සිද්ධ වුනා.! ලස්සන පාට පාට එළි වගයක් අහස ඉඳලා.. නැව පැත්තට එන්න ගත්තා
යාළුවනේ... අන්න මොනවද එළි වගයක් මේ නැව පැත්තට... එනවා.. අර...අර...

සැකසුම : තිළිණ අලහකෝන්

බයිබලයේ වීර චරිත

# වීර දාවිත්

තෙවන කොටස

